# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


| | | |
|---|---|---|
| මගේ අංකය DSD/HO/04/LH/Revolving Fund<br>எனதுஇல.........................................<br>**My No** | ඔබේ අංකය<br>உமது இல..........................................<br>**Your No** | දිනය<br>திகதி ....2018.04.27.....................<br>**Date** |

සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/11(ආර්ථික සවිබලගැන්වීම්)

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

**ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන - 2018**
**ආර්ථික සවිබලගැන්වීමේ ව්‍යාපෘති සඳහා ජීවනෝපාය චක්‍රීය අරමුදල මඟින්**
**ණය පහසුකම් සලසාදීම**

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරිම උදෙසා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට අමතරව , ජීවනෝපාය චක්‍රිය අරමුදල මඟින්ද දිළිදුකම පිටුදැකීමේ ඉලක්ක සපුරා ගැනීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණය කර ඇති බව පළමුව ඔබ වෙත පෙන්වා දෙනු කැමැත්තෙමි.

02. ඒ අනුව ඇමුණුම 01 හි දැක්වෙන පරිදි 2018 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභින් සවිබලගැන්වීම සඳහා ජීවනෝපාය චක්‍රිය අරමුදලින් ණය ලබා දීමේ ඉලක්ක සෑම දිස්ත්‍රික්කයක් වෙතම ලබා දීමට මෙමඟින් කටයුතු කරමි. එමඟින් ණය ලබා දීම තවදුරටත් කාර්යක්ෂම කරමින් සමෘද්ධි ප්‍රතිලාභින් 15,450 ක් සවිබලගැන්වීමවෙනුවෙන් රු.මි. 772 ක්සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවත්නා ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ණය ලෙස ලබා දීමට අපේක්ෂා කරනු ලබන බව සියළු නිලධාරින් වෙත දන්වමි.

03. මෙහිදි සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක්ම ජීවනෝපාය චක්‍රීය අරමුදලේ පවත්නා මුදල් ශේෂයෙන් , අවම වශයෙන් 50% ක් වත් , ජීවනෝපාය ව්‍යාපෘති සඳහා සමෘද්ධි ප්‍රතිලාභින් වෙත ණය ලබා දෙමින් , දිස්ත්‍රික්කය වෙත ලබා දී ඇති ඉලක්කය සපුරාලීම අනිවාර්යය කරුණක් වේ.

04. ණය ලබා දීමේදී සැලසුම් හා මෙහෙයුම් අංශය විසින් නිකුත් කරන ලද සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/07 චක්‍රලේඛය පරිදි ඉහළ හා මධ්‍යම ආදායම් කාණ්ඩයන් ඉලක්ක කර ගැනිම වඩාත් සුදුසු වන අතර, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා ණය ලබා දීමට කටයුතු කල කල යුතු බවද පෙන්වා දෙමි.


**1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල./1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1stStep, 4 th floor, SethsiripayaBattaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ(මානව සම්පත්)<br>பணிப்பாளர் (மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

I. ව්‍යවසායන් ප්‍රවර්ධනය තුළින් වැඩි සෘජු හා වක්‍ර රැකියා ප්‍රමාණයක් උත්පාදනය වන්නේ නම් , එවැනි ව්‍යාපෘති/ව්‍යවසායන් හී ණය අවශ්‍යතා සපුරාලීම.

II. නව ව්‍යාපෘති බලගැන්වීම හා නව නිෂ්පාදන තුළින් නිපදවන භාණ්ඩ දේශීය හා විදේශීය වෙළඳපලට යොමු කිරිම සඳහා වූ ණය.

III. පවත්නා ව්‍යාපෘති ඉහළ මට්ටමක් කරා රැගෙන යාමට අවශ්‍ය සංවර්ධන මූල්‍ය ණය පහසුකම් සැපයීම.

IV. පෞද්ගලික අංශයේ ව්‍යවසායන් සමඟ සමෘද්ධි ව්‍යවසායකයින්ට පෙර ගිවිසුම් මත පදනම්ව ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය ණය ලබා දීම.

V. ජීවනෝපාය ව්‍යාපෘතියක් සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා අවශ්‍ය වූ යටිතල පහසුකම් ලබා කර දීම සඳහා වූ ණය.

VI. ගමේ පවත්නා විශේෂ සම්පත් උපයෝගී කරගනිමින් , පරිසර හිතකාමී නිෂ්පාදන ඇති කිරීම සඳහා වූ ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා වූ ණය.

VII. නව ව්‍යවසායකයන් සඳහා මූලික පියවරේදී පහසු ඇප සුරැකුම් මත ණය පහසුකම් සැපයීම.

## 05. පොදු උපදෙස්

I. ණය ලබාදීමේදී , සවිබලගැන්විය හැකි ඉලක්ක කරා රැගෙන යා හැකි සමෘද්ධි පවුල් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ණය ලබා ගැනීමෙන් අනතුරුව පවත්නා හෝ ආරම්භ කල ව්‍යාපෘති තුළින් අදාළ ව්‍යාපෘතිලාභියාගේ ආදායම් මට්ටම ඉහළ මට්ටමකට රැගෙන යාම අවශ්‍ය වන අතර, ඒ බව තහවුරු කර ගත හැකි වන පරිදි වාර්තා පවත්වා ගැනිමද අවශ්‍ය වේ.

II. වර්ෂ අවසානයේ තොරතුරු ලබා දීමට හැකිවන පරිදි , චක්‍රීය ණය ලබා ගත් ව්‍යාපෘතියේ විස්තර සහිතව ( ආදායම ඉහළ යාමද ඇතුළුව ) ණයලාභීන්ගේ නාම ලේඛණය නිවැරදිව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

III. මේවනවිටත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා නිකුත් කර ඇති ණය චක්‍රලේඛ අනුව , ණය සීමාවන්ට අනුගත වෙමින් ණය ලබා දීමට කටයුතු කල යුතුවේ.

IV. සවිබලගැන්විය හැකි පවුල් විසින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ආදායම් මට්ටම තවදුරටත් ඉහළට ගෙනයාමට අවශ්‍ය වන යතුරු පැදියක් , කුඩා පරිමාණයේ ලොරි රථයක්,යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනිම සඳහා ණය පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේ නම් , ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛවල සඳහන් උපදෙස් අනුගමනය කල යුතුය.

V. මෙම චක්‍රලේඛ උපදෙස් පරිදි ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ලබා දීය යුතු ණය ඉලක්ක සපුරාලීම අත්‍යවශ්‍ය වන අතරම , එසේ කල නොහැකි වූ අවස්ථාවන්හීදි අදාළ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුවේ.

VI. තවද ජීවනෝපාය ව්‍යාපෘතියක් ආරම්භ කර පවත්වාගෙන යන ව්‍යාපෘතිලාභීන් සඳහා ව්‍යාපෘතියට අවශ්‍ය ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වෙනුවෙන්ද, මෙමගින් ණය පහසුකම් සලසා දිය හැක. මෙය අනිවාර්යයෙන් ව්‍යාපෘතිය හා සම්බන්ධ ගොඩනැගිලි හෝ යටිතල පහසුකමක් වීම අත්‍යාවශ්‍ය වේ.

VII. ණය ලබාදීමට පෙර අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමණාකරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරු මෙම ව්‍යාපෘතිවල ඇති ශක්‍යතාවය සම්බන්ධයෙන් සෑහීමකට පත්වීම අත්‍යාවශ්‍ය වන අතරම ණය ලබාදීමෙන් අනතුරුවද පසු විපරම අනිවාර්යවේ.

VIII. ණය ලබාදීමේදී පෙර ණය පැහැර හැරීම් / ගිවිසුම් කඩ කිරීම හා වෙනත් අයුරකින් විශ්වාසය කඩ කිරීම් සිදු කර ඇත්ද යන්න පිළිබඳව විමසා බැලීම අවශ්‍ය වන අතර එවැනි සාමාජිකයින්ට ණය ලබා දීම නොකල යුතුය.

IX. සෑම ණය මුදලක්ම සමෘද්ධි ප්‍රජාමූල බැංකු ණය ක්‍රමවේදයන්ට අනුගත වෙමින් ලබාදීම අවශ්‍ය වන අතර අවශ්‍ය නිර්දේශයන් හා අනුමැතියද ඒපරිද්දෙන්ම ලබා ගත යුතුය.

X. මෙහිදී ණය අයකර ගැනීමේ අවධානම ප්‍රධාන වශයෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් දැරිය යුතු වන නිසා අදාළ සෑම සමෘද්ධි නිලධාරීයෙකුගේම කැපවීම හා දායකත්වය විශේෂයෙන් වැදගත් වේ.

XI. තවද පුද්ගල ආර්ථික සංවර්ධනයට මෙන්ම රටේ සංවර්ධනයට බෙහෙවින් ඉවහල්වූ , එහෙත් විවිධ හේතු නිසා ණය ගලා නොයන සුවිශේෂී සුළු පරිමාණ ව්‍යාපෘතීන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

XII. මීට පෙර ලබා දී ඇති උපදෙස් අනුව, නියමිත දිනට නිවැරදිව, අදාළ ආකෘති පත්‍රවලට අනුව ප්‍රගතිය ලබා දීමට කටයුතු කල යුතු අතර සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/03 (ආර්ථික සවිබලගැන්වීම්) හා 2018.03.07 දිනැති චක්‍රලේඛයේ අංක 14 මගින් දැක්වෙන අදාළ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමද අවශ්‍ය වනු ඇත.

XIII. එසේම ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ණය ලබා දීම සම්බන්ධයෙන් මීට පෙර ඔබ වෙත දන්වා ඇති පරිදි නියමිත ඇප සුරැකුම් කෙරෙහිද අවධානය යොමු කළ යුතු අතර , සුදුසු පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට කටයුතු කල හැක.

XIV. සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති වැඩසටහනේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට ප්‍රතිලාභී දායකත්වය සපුරා ගැනීමට චක්‍රීය අරමුදලින් ලබා දී ඇති ණය නොසලකා හැර , මෙම චක්‍රලේඛ උපදෙස්හි සඳහන් දිස්ත්‍රික් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය.

XV. මෙම චක්‍රලේඛ උපදෙස් මත ජීවනෝපාය වක්‍රීය ණය මුදල් දීමේදී, දැනටමත් සමෘද්ධි බැංකුව මගින් ක්‍රියාත්මක වෙනත් ණය යෝජනා ක්‍රම මගින් හෝ බාහිර ආයතන/පාර්ශව මගින් ලබාගෙන තවදුරටත් ගෙවීමට ඇති ණය මුදල් පිළිබඳව මෙන්ම ,මෙහිදී ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල් ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳවද සොයා බලා ණය මුදා හැරීම සිදු කල යුතුය.

XVI. ජීවනෝපාය වක්‍රීය අරමුදලින් ණය නිකුත් කිරීමේදී ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් නිකුත් කරන ලද අදාළ චක්‍රලේඛ හා ඊට එකතුන් හි උපදෙස් ද තවදුරටත් වලංගු කර ගැනීමට කටයුතු කල යුතුය.

මෙම වැඩසටහන තුළින් සවිබලගැන්වූ සමෘද්ධිමත් ප්‍රජාවක් ගොඩ නන්වමින් දරිද්‍රතාවය තුරන් කිරිමට ඔබ දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්-
1. ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබද අමාත්‍යාංශය - කා.දැ.ගැ. පි.
2. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන /සමෘද්ධි), සමාජ සවිබලගැන්වීම් ,සුබසාධන හා කන්ද උඩරට උරුමයපිළිබද අමාත්‍යාංශය - කා.දැ.ගැ. පි.
3. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
4.විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ. පි.
5 ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ. පි.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ. පි.
7. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ. පි.
8..සියළුම සමෘද්ධි මූලස්ථාන කළමණාකරුවන් -කා.දැ.ගැ.පි. හා අනෙකුත් සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැණුම්වත් කිරීමසඳහා